www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලමුන් දෙදෙනාගේ මරන ශ්‍රී ලංකාවේ බියකරු සමාජ අර්බුදය විදහා දක්වයි

## Two deaths highlight Sri Lanka's terrible social crisis

වසන්ත රූපසිංහ විසිනි
2010 මාර්තු 31

මෙම මාසය තුල සිදුවූ ඛේදවාචක දෙකකින් ශ්‍රී ලංකාවේ දුප්පත්කමින් බැටකන පවුල් මුහුන දී සිටින බියකරු ඉරනම ඉස්මතු කර දක්වයි. ඉසිලිය නොහැකි ආර්ථික ප්‍රශ්න වලින් ගැලවී යාමේ මඟක් නොදුටු මව්වරුන් දෙදෙනෙකු තම දරුවන්ගෙන් එක් අයෙකු බැගින් ප්‍රාදේශිය ගංගා දෙකක ගිල්වා දැමූහ.

කොලඹ සිට කිලෝ මීටර් 40ක් දකනෙන් වූ කලුතර නගරයේ කලු ගඟට දරුවන් පස් දෙනෙකුගේ මවක් වන මානෙල් පුෂ්පලතා මාර්තු 10වෙනි දින වසර දෙකකුත් මාස අටක් වයසැති තම දරුවා විසි කර දැමුවාය. දිවි ගලවා ගැනීමට පොරබදින දරුවා දුටු ලොරි රථ රියදුරෙකු ඔහු දියෙන් ගොඩ ගත් නමුත් දින කීපයකට පසුව දැඩි සත්කාර ඒකකයකදී මිය ගියේය.

මාර්තු 20වෙනි දින, දකුනු පලාතේ ම අම්බලන්ගොඩ නගරයේ දරුවන් පස් දෙනෙකුගේ මවක් වන කේ. පී. රාජිනී එදින ම උපත ලැබුවේයැයි සැලකෙන සිය බිලිඳා පොලිතින් කවරයකින් ඔතා යාබද ගඟකට විසිකලේයැයි සැක කරනු ලැබීය. බිලිඳාගේ සිරුර පසුව සොයා ගැනින. කාන්තාවන් දෙදෙනා ම පොලිසිය විසින් රැඳවුම්භාරයට ගත් අතර බරපතල සාපරාධි චෝදනාවලට ලක් වූහ.

එවන් දුරකට ස්ත්‍රීන් දෙදෙනා තල්ලු කරනු ලැබ මූලික සමාජ අර්බුදයෙන් මහජන අවධානය වෙනතක හැරවීමේ අරමුනින් ස්ත්‍රීන් දෙදෙනාගේ "කෲරත්වය", "අමානුෂිකත්වය" සහ "සාපරාධිභාවය" ගර්හාවට ලක් කෙරෙන බඩ දඟලන සදාචාර සම්පන්නභාවයේ ප්‍රවාහයක් කොලඹ මාධ්‍යයන් හරහා මුදා හැරින.

ලංකාදීප පුවත්පතේ මාර්තු 17 කලාපයෙන් මෙම මරන සමාජ ප්‍රශ්නයක් වසයෙන් දැකීමට එරෙහිව නොවහලහා සිය කතුවැකිය යොදා ගත්තේය. "ඒ මවගේ මාරක තීන්දුවට බලපෑ කොන්දේසීන් කවරක් වුව ඇගේ ක්‍රියාවට සමාව දිය නොහැකිය" පුවත්පත සඳහන් කලේය. "මේ මව්වරුන්ට ස්වාභාවික යුක්ති ධර්මයේ ආශිර්වාදය හෝ අහිමි වනු ඇත. එය එසේ විය යුතුය. ඒ සම්බන්ධයෙන් විරුද්ධ තර්ක ගොඩ නැඟීම යනු අනියම් මිනීමැරුමකට වැරදිකාරයෙකු විය හැකි තරමිය," යනුවෙන් කතුවැකිය අවසන් කලේය.

ලක්බිම පුවත්පතේ කතුවැකියකින් වඩාත් නරුම ප්‍රවේශයක් ගනිමින් මෙම මරනද්වය, මව්වරුන් තම දරුවන් කෙරේ වගකීම ඉටු කිරීමට අසමත් වීමේ පුලුල් සමාජයීය ප්‍රපංචයක කොටසක් යයි කියා පෑවේය. වත්මන් සමාජයේ බොහෝ කතුන් විවිධ බෞද්ධ ජාතක කතාවල ඉගැන්වෙන ලෙස තම දරුවන් පිලිබඳ "මාතෘ ප්‍රේමය අහිමිකරගෙන ඇත" යි කතුවරයා ලීවේය. අවධාරානාත්මක පනිවිඩය වූයේ පූර්ව භවයන්හි කරන ලද වැරැද්දක ප්‍රතිඵලයක් වශයෙන් නියත ලෙස හිමිවන දුප්පත්කම භාරගත යුතුයැයි කියන "කර්මය" පිලිබඳ ප්‍රතිගාමී බෞද්ධ මතයට කරන ආයාචනයකි.

රටේ නාගරික සහ ග්‍රාමීය දුප්පතුන් මුහුන දෙන වඩාත් නරක අතට හැරෙමින් පවත්නා කොන්දේසි සම්බන්ධයෙන් පිලිවෙලින් බලයට පත් කොලඹ ආන්ඩුවලට සහ ලාභ පද්ධතියට ඇති වගකීම ගැන සඳහන් කිරීම කෙසේ වෙතත් ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි අංශු මාත්‍රයක හෝ සානුකම්පිකභාවයක් මෙම මාධ්‍ය ප්‍රවාහය තුල නොතිබුනි.

දුප්පත් ගැමි පවුල් දෙකකට අයිති කාන්තාවන් දෙදෙනාට ම බාලවියේදී ම පාසල් අත්හැරීමට සිදු වූ අතර දිවි ගැට ගසා ගැනීමට ඉමක් නැති දෛනික අරගලයට ඔවුහු මුහුන දුන්හ. 2004 වසරේ දිවයිනේ මුහුදුබඩ පෙදෙස්වලින් ඉමහත් ප්‍රමානයක් විනාශභාග් කල ආසියානු සුනාමිය විසින් ඔවුන්ගේ ජීවිත කීතු කර දැමූ අතර, දෙපයින් යලි නැඟී සිටීමට දැරූ ප්‍රයත්නයේදී ඔවුනට ආන්ඩුවෙන් ලැබුනේ හිඟමන් ආධාරයකි. ඔවුන් ඔවුන්ගේ ගම්වලින්, ඔවුන්ගේ සමාජයීය සහජීවන ජාලයෙන් සහ ඔවුන්ගේ ජීවිකා වෘත්තීන්ගෙන් කපා වෙන් කරනු ලැබීය.

අනන්ත දුෂ්කරතාවලින් පසු, කොලඹට දකුනෙන් වූ ප්‍රදේශයක පිහිටි නිවාස ඒකක 600කින්

යුත් සුනාමි නිවාස සංකීර්නයක කුඩා නිවසක් පුෂ්පලතාගේ පවුලට ලැබින. ඇගේ සැමියා ලොතරැයි ටිකට් විකුනා ලබන රුපියල් 350ක් හෙවත් ඩොලර් 3ක දෛනික ආදායම දිනක කෑමට යන්තම් ප්‍රමානවත් වූ අතර ලමුන් පාසල් යැවීමක් සිදු කිරීමේ හැකියාවක් තිබුනේ නැත. මුදල් අගහිඟකමින් පීඩිත වූ පුෂ්පලතා ද ලොතරැයි ටිකට් විකිනීම ආරම්භ කල නමුදු, ඇගේ දරුවන් පස් දෙනාද කැටුව ඒමට - ටිකට් විකිනීමට බාධකයක් බැවින් - ටිකට් ඒජන්තවරයා සිය විරෝධය පල කලේය. ඇගේ බාලම දරුවා නිවසේ තබා යෑමට නොහැකි වූ ඇය ඔහු දියට විසි කිරීමට තීන්දු කලාය.

රාජිනීගේ කතාවද මෙයට වෙනස් නැත. ඇගේ සැමියා ඇයගෙන් දික්කසාද වීමෙන් අනතුරුව සිය දරුවන් තිදෙනා සහ මව නඩත්තු කිරීමට ඇයට සිදුවිය. මැදපෙරදිග ගෘහ සේවිකාවක් වසයෙන් සේවය කල ඇය 2004 වසරේදී යලි මෙරට පැමිනි අතර එම වසරේ ඇගේ සකල සේසතම සුනාමිය විසින් අතුගා ගෙන ගියේය. යලි වතාවක් ඩුබායි වෙත පිටව යන ඇයට පැපොල රෝගය වැලඳීම නිසාවෙන් කෙටිකලකින් පෙරලා පැමිනීමට සිදු වේ. පෞද්ගලික ආධාර මත ගොඩ නැගුනු සුනාමි නිවාස සංකීර්නයක ජීවත් වන ඇය කුඩා කඩ තට්ටුවකින් දෛනිකව රුපියල් 50ක සොච්චමක් ඉපැයූ අතර මාලු වෙලඳ පොලේ සහායකයෙකු වසයෙන් වැඩ කරමින් ඇගේ පුතා දිනකට රුපියල් 300ක් ඉපැයීය. ඩුබායිවල වැඩට යාමට ඇය විසින් නයට ගත් රුපියල් ලක්ෂ දෙකක මුදලක් තවමත් ගෙවීමට තිබෙන අතර සියයට 10ක් වූ ඉහල පොලිය ගෙවීමට කිසිසේත් හැකියාවක් නැත. ඇය ගඟට විසි කලේයැයි කියන බිලිඳා ඇය ලැබුවේ ඩුබායිහිදී ඇතිවූ අසාර්ථක ප්‍රේම සම්බන්ධයකිනි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ අප්‍රේල් 8වෙනි දින මහමැතිවරනයේ ප්‍රචාරක ව්‍යාපාරයට සහභාගි වෙමින් තමන් බලයට පත් 2005 වසරේ සිට දල ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව ඒක පුද්ගල ආදායම දෙගුන කල බවත් ශ්‍රී ලංකාව ආසියාවේ නව විස්මය වෙමින් පවතින බවත් ඡන්ද දායකයාට කියමින් ස්වප්න ලෝකයක් නිර්මානය කර තිබේ. ජනාධිපතිවරයාගේ පච ගනන් හිලව්වලට 2008 වසරේදී සියයට 30ක ප්‍රතිශතයකට ලඟා වූ උද්ධමනය ගනන් ගැනී නැත. මහමැතිවරනයෙන් අනතුරුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම වන 2011 වසරේදී අයවැය හිඟය දැන් පවතින තත්වයෙන් අඩකට බස්සන ලෙස කරන ඉල්ලීම ඉෂ්ට කරනු පිනිස රාජ්‍ය වියදම්වල ඉමහත් කෙටීමකට සහ බදු ඉහල දැමීමට ආන්ඩුවට බල කෙරෙනු ඇත.

මිලියන ගනනාවක් වන ජනයා තම ජීවිත වඩාත් දුෂ්කර වෙමින් පවත්නා බවට යහමින් දැනුවත්ය. නිල ගනන් හිලව්වලට අනුව ජනගහනයෙන් සියයට 15ක් ජීවත් වන්නේ - අයෙකුට දිනෙක එක් හොඳ කෑම වේලක් සඳහා ප්‍රමානවත් - මසකට රුපියල් 3,087කට ගනන් බලා ඇති නිල දරිද්‍රතා රේඛාවට පහලිනි. සුදුසුකම් සපුරන පවුල්වලට මසකට ලබා දෙන රුපියල් 1000ක ආන්ඩුවේ සීමිත සමෘද්ධි සහනාධාර වැඩ පිලිවෙලෙන් යැපීමට මිලියන 1.6ක පමන ජනයාට බල කෙරී ඇත. පුෂ්පලතාගේ පවුල සමෘද්ධි ආධාර ලැබූ අතර රාජිනීගේ පවුලට නැත. මෙම සහනාධාරය පවා එය ලැබීමට අවැසි පවුල් දහස් ගනනකට ලැබී නැතැයි පසුගිය සතියේදී මාධ්‍ය ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන පිලි ගත්තේය.

කැකෑරෙන දරිද්‍රතාව නිමක් නැති පෞද්ගලික සහ සමාජයීය ප්‍රශ්න උත්පාදනය කරයි: යහපත් නිවාස නැතිකම, අහසට උස නය කන්දරාවක්, මන්දපෝෂනය, පාසල්වලට ප්‍රවේශය නොලැබීම සහ ලැයිස්තුව තව දුර කියාගෙන යා හැකිය. බොහෝ පවුල් සම්බන්ධයෙන් ගත් කල, ගිලන්වීමක්, මරනයක් හෝ රැකියා අහිමි වීමක්, ප්‍රමානවත් ආහාර තිබීම සහ නොතිබීම අතර වෙනස ඇති කිරීමට හේතු විය හැක. මංමුලා සහගත තත්වයන් මංමුලා සහගත ක්‍රියාවන්වලට තුඩු දෙයි. පසුගිය මැයි මස අවසන් වූ රටේ දිග් ගැස්සුනු සිවිල් යුද්ධය අතරවාරයේදී දස දහස් ගනනක් දුප්පත් ගම්බද තරුනයින් හමුදාවට බැඳුනේ තම පවුල් නඩත්තු කල හැකිවේය යන අදහසිනි. තම මූල්‍යමය ප්‍රශ්නවලට විසඳුමක් නොදුටු ගොවියෝ ඔවුන්ගේ නයෙන් තම පවුල් නිදහස් කර ගැනීමට දිවි නසා ගත්හ.

සාමාන්‍ය පුරුද්දක් වසයෙන් සමාජ විභේදනය ගැඹුරුවන තරමට දුගීන්ගේ ඉරනම සම්බන්ධයෙන් දේශපාලනික සංස්ථාපිතයේ නරුමත්වය සහ පිලිකුල ද සුවිසල් වේ. මව්වරුන් දෙදෙනා ගැරහීමට සහ ඔවුන්ගේ මෘත දරුවන් පිලිබඳ කිඹුල් කඳුලු සැලීමට කැපකෙරුනු කොලඹ මාධ්‍යයන්ගේ පුවත්පත් තීරු ලිපි වලට, ප්‍රමානවත් ආහාර, නිවාස සහ අධ්‍යාපනය නොමැතිව දිනපතා දිවි ගෙවෙන බොහෝ තරුනයින් ගැන කීමට කිසිත් නැත. එපමනක් නොව, පුෂ්පලතාට සහ රාජිනීට දඬුවම් කරනු වස් මුලුමනින්ම නීතිය ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය මෙම පුවත් පත් බිස්සම සිවිල් යුද්ධයේ අවසන් මාසවල දහස් ගනන් පිරිමින්, ගැහැනුන් සහ ලමයින් ඝාතනය කල මිලිටරි ක්‍රියාදාමයන් සහ මිලියන කාර්තුවකට වැඩි දෙමල සිවිල් වැසියන් රැඳවුම් කඳවුරුවල නීති විරෝධීව ගාල් කර තබා ගැනීම ආරක්ෂා කලේය.

කතුන් දෙදෙනා පිලිබඳ ලංකාදීප කතුවැකිය, සමාජ හා ආර්ථික ප්‍රශ්න ගැන එය කීමට සිතුවාට වැඩි යමක් කියැවී තිබේ. "එක් අතකින් [රටේ] ආර්ථික ප්‍රශ්න මහමෙර පරයා උස්ව නැගෙමින් තිබේ. දරිද්‍රතාවෙහි පත්ලටම ඇද වැටුනු ජන සමූහයාගේ

ජීවිත නඟා සිටුවීම සඳහා ක්‍රමවත් හා ඉක්මන් ක්‍රමෝපායක් ආදේශ නොවුනු සමාජයක ජීවත්වීමට වඩා මරනය සැපතකැයි සිතෙන සිතුවිලි සාධාරනීකරනය කරගත හැකි සමාජයකි.” පුවත්පත සාවද්‍ය තෝරා ගැනීමක් - දුප්පත්කම හෝ මරනය - ඉදිරිපත් කරයි, එහෙත් ඒ මිලියන ගනනක් ජනයා මුහුන දෙන දැවැන්ත සමාජයීය සහ ආර්ථික ප්‍රශ්න කිසිසේත්ම විසඳීමට වත්මන් සමාජය, ධනවාදී සමාජය මුලුමනින්ම අසමත් බව යහමින් දැනුවත්ව සිටිමිනි.

කම්කරු පන්තියට සැබෑ විසඳුමක් පවතී. පවත්නා සමාජ ක්‍රමය ජනතාව සඳහා සහන සැලසීමට අසමත් නම්, එවැනි සහන සලසනු ඇති ක්‍රමයකින් එය විස්ථාපනය කල යුතුය. කම්කරු පන්තිය විසින් නිර්මිත දැවැන්ත සම්පත් ප්‍රමානය ධනවතුන් අතලොස්සකගේ ලාභය තර කිරීමට වඩා තමන්ගේ සමාජයීය අවශ්‍යතා සපුරා ගැනීමට යොදාගත හැකි වන්නේ ශ්‍රී ලංකාවේ සහ සමස්ත කලාපයේ මෙන්ම ජාත්‍යන්තරව ද සමාජවාදී පිලිවෙත් ඔස්සේ සමාජය ඉහල සිට පහලට යලි ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පමනකි. ධනපති පන්තියේ සියලුම පක්ෂවලින් සපුරාම දේශපාලනිකව බිඳී ගැනීමක් සහ කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන් වැදීමට කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලනික ව්‍යාපාරයක් ගොඩ නැගීම එය විසින් ඉල්ලා සිටියි. සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරි දර්ශනය වන්නේ එයයි.

© www.wsws.org